# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1990 අංක 40 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1990 නොවැම්බර් මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1990 නොවැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 1.50 යි. තැපැල් ගාස්තුව : රු. 1.55 යි.

## 1990 අංක 40 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 නොවැම්බර් මස 20 වන දින]

එල්.ඩී.—ඕ. 22/90

**1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1990 අංක 40 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**1989 අංක 13 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.**

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ආ) සහ (ඇ) ඡේද ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ආ) නිෂ්පාදන බදු අධ්‍යක්ෂවරයෙක් සහ මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි නිෂ්පාදන බදු නිලධරයන් වන නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යක්ෂවරුන්, අධිකාරීන්, ප්‍රධාන පරීක්ෂකවරුන් සහ පරීක්ෂකවරුන් සංඛ්‍යාවක් ; සහ

(ඇ) ඉහත සඳහන් නිලධරයන්ට සහායවීම සඳහා අවශ්‍ය විය හැකි පරිපාලන, ගිණුම්, කාර්මික සහ ලිපිකරු සහ කණිෂ්ඨ සේවක සංඛ්‍යාවක්.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ අලුත් 3අ සහ 3ආ වගන්ති ඇතුළත් කිරීම.**

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර එම වගන්ති එම ප්‍රඥප්තියේ 3අ සහ 3ආ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:—

"යම් විදේශ රාජ්‍යයක ආණ්ඩුවේ ශ්‍රී ලංකා නියෝජිතයන් නිෂ්පාදන බදු ගෙවීමෙන් නිදහස් කිරීම.

3අ. (1) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, (කවර නාමයකින්, අභිධානයකින් හෝ පදවි නාමයකින් හැඳින් වුව ද) යම් විදේශ රාජ්‍යයක ආණ්ඩුවේ ශ්‍රී ලංකා නියෝජිතයා, එවැනි යම් ආණ්ඩුවක ශ්‍රී ලංකාවේ සිටින වෙළෙඳ කොමසාරිස්වරයා, සහ ඒ නියමයේ නම් කරන ලද එවැනි යම් නියෝජිතයකුගේ හෝ කොමසාරිස්වරයකුගේ කාර්ය මණ්ඩලයේ තැනැත්තන් හෝ එක්සත් ජාතීන්ගේ හෝ එහි අනුබද්ධ සංවිධානවල, ආයතනවල හෝ මණ්ඩලවල ශ්‍රී ලංකාවේ සිටින නියෝජිතයන් නැතහොත් ජාත්‍යන්තර සංවිධානවල, ආයතනවල හෝ මණ්ඩලවල නියෝජිතයන් වෙත ප්‍රේෂණය කරන ලද නැතහොත් ඔවුන් විසින් හෝ ඔවුන්ගේ පාවිච්චිය සඳහා ආනයනය කරන ලද හෝ බැඳුණු ගුදමෙන් නිෂ්කාශණය කරන ලද නිෂ්

පාදන බද්දට යටත් භාණ්ඩ මත අය කළ යුතු නිෂ්පාදන බදු ගෙවීමෙන් කලින් කල ඔවුන් නිදහස් කරනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින්, ස්වකීය අභිමතය පරිදි, ඒ නියමය මගින්—

(අ) නිදහස් කිරීමට ඉඩ දෙනු ලබන්නේ යම් කොන්දේසි වලට යටත්ව ද, ඒ කොන්දේසි කිසිවක් වේනොත්, ඒ කොන්දේසි නියම කරනු ලැබිය හැකි ය;

(ආ) ඒ නිදහස් කිරීම, ඒ විදේශ රාජ්‍යවල ඒ නියෝජිතයන්ගේ, කොමසාරිස්වරයන්ගේ හෝ තානාපතිවරයන්ගේ පවුල් සහ පවුලේ පිරිවර වෙත ප්‍රේෂණය කරන ලද නැතහොත් ඔවුන් විසින් හෝ ඔවුන්ගේ පාවිච්චිය සඳහා ආනයනය කරන ලද නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ සම්බන්ධයෙන් ව්‍යාප්ත කරනු ලැබිය හැකි ය;

(ඇ) යම් නිශ්චිත රටක, ශ්‍රේණියක හෝ පන්තියක නියෝජිතයන්ට, කොමසාරිස්වරයන්ට හෝ තානාපතිවරයන්ට නැතහොත් යම් නිශ්චිත විස්තරයක නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩවලට ඒ නිදහස් කිරීම සීමා කරනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් ඔහුගේ අභිමතය පරිදි ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, මේ වගන්තිය යටතේ කරන ලෙස යම් නිදහස් කිරීමක් ඉල්ලා අස්කර ගැනීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම නැතහොත් නිදහස් කිරීමට ඉඩ දෙනු ලැබුවේ යම් කොන්දේසිවලට යටත්ව ද එම කොන්දේසි වෙනස් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරනු ලබන සෑම නියමයක්ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයෙහි හෝ ඒ නියමයෙහි සඳහන් කරනු ලබන යම් පසු දිනයක හෝ බලාත්මක විය යුතු අතර ඒ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනයෙහි සිට මාස තුනක කාල සීමාවක් ඇතුළත දී හෝ ඒ කාලසීමාව ඇතුළත පාර්ලිමේන්තුවේ රැස්වීම් නොපැවැත්වේ නම් ඒ කාල සීමාව අවසාන වීමෙන් පසු පැවැත්වෙන ප්‍රථම පාර්ලිමේන්තු රැස්වීමේදී, එම නියමය අනුමත කළ යුතු බවට වූ යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන යම් නියමයක්, එම නියමය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි ඒ ප්‍රතික්ෂේප කිරීමේ දින සිට ප්‍රත්‍යාදිෂ්ට කරන ලද සේ සැලකිය යුතු ය. එම නියමය එසේ ප්‍රත්‍යාදිෂ්ට කරන ලදැයි සැලකෙන දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ වූ යම් නියමයක කුමක් සඳහන් වුවද, ඒ නියමය අදාළ වන්නා වූ නිෂ්පාදන බද්දට යටත් කිසිම භාණ්ඩයක්, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ව අවසරය නොමැතිව සහ විකිණීමේ හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීම සිදු කරන අවස්ථාවේ දී නිෂ්පාදන බද්දට යටත් එම භාණ්ඩය මත ගෙවිය යුතු නිෂ්පාදන බද්ද අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ගෙවනු ලැබ ඇත් නම් මිස, ඒ විකිණීම හෝ බැහැර කිරීම කරනු නොලැබිය හැකි ය. මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන කඩකරමින් විකුණන ලද හෝ බැහැර කරන ලද නිෂ්පාදන බද්දට යටත් යම් භාණ්ඩයක් රාජ සන්තක කරනු ලැබීමට යටත් විය යුතු ය.

ඇතැම් භාණ්ඩ නිෂ්පාදන බද්ද ගෙවීමෙන් නිදහස් කිරීම.

3ආ. පහත දැක්වෙන භාණ්ඩ නිෂ්පාදන බද්ද ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතුය :—

(අ) ජනාධිපතිවරයාගේ නිල පරිහරණය සඳහා ආනයනය කරන ලද හෝ බැඳුණු ගුදමෙන් නිෂ්කාශණය කරන ලද සෑම විස්තරයකම භාණ්ඩ ; සහ

(ආ) රේගු තීරු බදු රහිත සාප්පුවකින් මිලදී ගනු ලබන හෝ ලබා ගන්නා ලද සෑම විස්තරයකම භාණ්ඩ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ඉවත් කර ගෙන යාම පිළිබඳ දැන්වීම.

4. (1) නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ කිසිවක් සාදන්නකු, එම නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ වලින් යම් ප්‍රමාණයක්, එම භාණ්ඩ නිෂ්පාදනය කරන ලද නැතහොත් සාදන ලද කර්මාන්ත ශාලාවේ සිට හෝ වෙනත් ස්ථානයක සිට ඉවත් කරගෙන යන හෝ ඉවත් කරගෙන යාමට සලස්වන අවස්ථාවක, ඔහු විසින් ඒ කරුණු පිළිබඳව, එසේ ඉවත් කරගෙන යාමේ දින සිට මාස තුනක කාලයක් ඉකුත් වීමට පෙර දැනුම් දීමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත හෝ ඒ

කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරන ලද නිෂ්පාදන බදු නිලධරයකු වෙත කරනු ලැබිය යුතු ය.

(2) නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ කිසිවක් ආනයනය කරන්නකු, එම නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ වලින් යම් ප්‍රමාණයක්, එම නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ ආනයනය කිරීමෙන් පසුව ගබඩා කරනු ලැබූ රේගු ගුදමෙහි නැත හොත් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ලද වෙනත් ස්ථානයක සිට ඉවත් කරගෙන යන හෝ ඉවත් කරගෙන යාමට සලස් වන අවස්ථාවක, ඔහු විසින් ඒ කරුණ පිළිබඳව, ඉවත් කරගෙන යාමේ දින සිට මාස තුනක කාල යක් ඉකුත් වීමට පෙර දැනුම්දීමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරන ලද නිෂ්පාදන බදු නිලධරයකු වෙත කරනු ලැබිය යුතු ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.**

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :—

"(අ) ඒ නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩය ශ්‍රී ලංකා වෙහි නිෂ්පාදනය කරන ලද හෝ සාදන ලද හෝ අවස්ථාවක දී, ඒ නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩය නිෂ්පාදනය කරන ලද හෝ සාදන ලද හෝ කර්මාන්ත ශාලාවෙහි නැතහොත් වෙනත් ස්ථාන යෙහි සිට එය ඉවත් කරගෙන යාමෙන් පසු නිෂ්පා දන බද්දට යටත් භාණ්ඩයේ නිෂ්පාදකයා හෝ සාදන්නා හෝ විසින් නියමිත ආකාරයට ගෙවනු ලැබිය යුතු අතර එම බද්ද, එසේ ඉවත් කරගෙන යාම සිදුවන වර්ෂයේ එක් එක් කාර්තුවේ අවසාන දිනය සිට එක් ලිත් මාසයක් ඇතුළත ගෙවනු ලැබිය යුතු ය ; නැතහොත්

(ආ) ඒ නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩය ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබ ඇති අවස්ථාවක, එය ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ විගසම එය ගබඩා කර තබනු ලැබූ රේගු ගුදමෙහි හෝ වෙනත් ස්ථානයෙහි සිට එය ඉවත් කරගෙන යාමෙන් පසු ඒ නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයේ ආනයන කරු විසින් නියමිත ආකාරයට ගෙවනු ලැබිය යුතු අතර එම බද්ද, එසේ ආනයනය කිරීම සිදු වන වර්ෂයේ එක් එක් කාර්තුවේ අවසාන දින සිට එක් ලිත් මාසයක් ඇතුළත ගෙවනු ලැබිය යුතු ය.";

(2) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) මේ පනතේ කුමක් සඳහන් වුවද, (3අ සහ 3ආ වගන්තිවල අර්ථානුකූලව නිදහස් කරන ලද භාණ්ඩයක් නොවන්නා වූ) ශ්‍රී ලංකාවෙන් පිටතදී නිෂ්පාදනය කරන ලද නිෂ්පාදන බද්දට යටත් යම් භාණ්ඩයක් ආනයනය කරන සෑම තැනැත්තෙක්ම, ඒ නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩය ගබඩා කර තබනු ලැබූ රේගු ගුදමෙහි හෝ වෙනත් ස්ථානයෙහි සිට එය ඉවත් කරගෙන යාමට පෙර, 3 වන වගන්තිය යටතේ තීරණය කරන ලද නිෂ්පාදන බදු අනුප්‍රමාණය අනුව, රේගු ආඥා පනත යටතේ තීරණය කරන ලද එම භාණ්ඩයේ පිරිවැය, රක්ෂණ සහ නැව් ගාස්තු මත ඔහු විසින් ආනයනය කරන ලද භාණ්ඩය සම්බන්ධයෙන් නිෂ්පාදන බදු කොටස් වශයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවිය යුතු ය. එම භාණ්ඩය ගබඩා කර තබනු ලැබූ රේගු ගුදමෙහි හෝ වෙනත් ස්ථානයෙහි සිට එය ඉවත් කර ගෙන යාමෙන් පසු එම භාණ්ඩය මත අයවිය යුතු නිෂ්පාදන බද්දේ වෙනස 5(1) (ආ) වගන්තියේ දක්වා ඇති ආකාරයට ගෙවිය යුතු ය. තවද, එම භාණ්ඩය මත ගෙවිය යුතු සම්පූර්ණ නිෂ්පාදන බද්ද 7 වන වගන්තිය යටතේ නිශ්චය කරනු ලබන වටිනාකමට අනුව විය යුතු ය.

(3) නිෂ්පාදන බද්දට යටත් යම් භාණ්ඩයක් මත ගෙවිය යුතු නිෂ්පාදන බද්ද (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ගෙවනු නොලැබූ අවස්ථාවක, එම නිෂ්පාදන බද්ද ගෙවීම පැහැර හරිනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුවද, අපනයනය කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවෙහි නිෂ්පාදනය කරන ලද හෝ සාදන ලද නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයක්, එම නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩය යවනු ලබන වරායෙහි ගොඩබෑම සඳහා බැඳුම්කරයක් ලියා අත්සන් කර ඇත්නම්, එම භාණ්ඩය නිෂ්පාදන බද්ද ගෙවීම සඳහා යටත් කරනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 5අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එම වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 5අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය :—

"ඇතැම් අවස්ථානුගත කරුණුවල දී නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩවල විකුණුම් මිල තක්සේරු කිරීමට අධ්‍යක්ෂ ජනරාල් වරයාට ඇති බලය.

5අ. නිෂ්පාදන බද්දට යටත් යම් භාණ්ඩයක් සාදන්නකුගේ, නිෂ්පාදකයකුගේ හෝ ආනයනය කරන්නකුගේ ව්‍යාපාරය පවත්වාගෙන යන යම් තැනැත්තකු විසින් නිෂ්පාදන බද්දට යටත් එම භාණ්ඩය බෙදා හැරීමේ කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ මතය අනුව, එම තැනැත්තා විසින් ගෙවිය යුතු නිෂ්පාදන බද්ද අඩු කරන හෝ අඩුවිය හැකි මිලකට විකුණනු ලබන අවස්ථාවක දී මේ පනතේ කාර්ය සඳහා, නිෂ්පාදන බද්දට යටත් එම භාණ්ඩය අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ මතය අනුව, එම විකිණීම සිදු වූ දිනයේ දී විවෘත වෙළඳ පොළෙහි එම භාණ්ඩයට ලැබෙන මිලකට විකුණනු ලැබූ ලෙසට සලකනු ලැබිය යුතු අතර, එම තැනැත්තාගෙන් අයකළ යුතු නිෂ්පාදන බද්ද ඒ අනුව ආගණනය කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ඉවත් කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියෙහි—

(අ) එහි (අ) ඡේදයෙහි (ii) වන අනුඡේදය ඉවත් කිරීමෙන්;

(ආ) එහි (අ) ඡේදයේ (iii) වන අනුඡේදය එහි (ii) වන අනුඡේදය ලෙස නැවත අංක කිරීමෙන්;

(ඇ) එම උපවගන්තිය අගට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

"(ඇ) 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත යටතේ නිෂ්පාදන බද්දට යටත් යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් පිරිවැටුම් බදු අයකිරීමට ඇති අවස්ථාවක දී පිරිවැටුම් බද්දේ කාර්ය සඳහා නියම කරනු ලැබිය හැකි ආකාරයට තීරණය කරනු ලබන නිෂ්පාදන බද්දට යටත් එම භාණ්ඩයේ ප්‍රකාශිත වටිනාකම.".

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියේ—

(අ) (ආ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්—

"(ආ) ඉවත් කරගෙන යාමේ ස්ථානය යන්නෙන්—

(i) නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ සාදන හෝ නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවක් හෝ වෙනත් යම් ස්ථානයක් අදහස් වේ; හෝ

(ii) නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ ආනයනය කිරීමෙන් පසු එම භාණ්ඩ ගබඩා කර ඇත්තේ හෝ තබා ඇත්තේ යම් රේගු ගුදමක ද නැත හොත් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ලද යම් ස්ථානයක ද ඒ ගුදම හෝ ස්ථානය අදහස් වන අතර නිෂ්පාදන බද්දට යටත් ඒ භාණ්ඩ විකිණීමට පෙර ගබඩා කර තැබීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලියාපදිංචි කරන ලද වෙනත් යම් ස්ථානයක් ද එයට ඇතුළත් වේ.".

(ආ) (ඇ) ඡේදයෙහි ඇති "එම නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ සම්බන්ධයෙන් ගෙවිය යුතු නිෂ්පාදන බද්ද" යන වචනවල සිට එම ඡේදයේ අවසානය දක්වා ඇති වචන ඉවත් කොට ඒ වෙනුවට "ඒ ඇසුරුම් ද්‍රව්‍ය සම්බන්ධයෙන් ගෙවිය යුතු වන නිෂ්පාදන බද්ද, පිරිවැටුම් බද්ද සහ වෙනත් බදු ඇත් නම් ඒවා ද ඊට ඇතුළත් නොවේ;" යන වචන ආදේශ කිරීමෙන්.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එම වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය :— ප්‍රධාන ප්‍රඥප්තියෙහි 7 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"සාම්පල, ගිණුම් පොත්, ලේඛන, වාර්තා හෝ වෙනත් ලියවිලි ඉල්ලා සිටීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඇති බලය.

7අ. නිෂ්පාදන බද්දේ වටිනාකම නිසැකව දැන ගැනීමේ හෝ නිෂ්පාදන බද්ද අයකර ගැනීමට අදාළ යම් කරුණක් හෝ මේ පනත යටතේ පරීක්ෂණයක් පැවැත්වීම තම කාර්යය වන්නේ යම් කරුණක් පිළිබඳව ද එම කරුණ සම්බන්ධයෙන් හෝ සත්‍යායනය කිරීමේ කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් බලය දෙන ලද්දා වූ ද අධිකාරීවරයකුගේ නිලයට අඩු නොවන නිලයක්

දරන්නා වූ ද යම් නිෂ්පාදන බදු නිලධරයකු විසින් යම් තැනැත්තකුගේ බලයෙහි ඇත්තේ යම් තොරතුරු ද ඒ තොරතුරු සපයන ලෙස හෝ යම් නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයක් හා සම්බන්ධ යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් නැතහොත් ඒ බද්දට යටත් භාණ්ඩයක සාම්පල යම් තැනැත්තකුගේ බලයෙහි ඇත්තේ ද ඒවා පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලෙස ද ඒ තැනැත්තා වෙත ලියවිල්ලකින් වූ නියමයක් මගින් නියම කරනු ලැබිය හැකි අතර ඒ නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන ස්ථානයක දී සහ කාලසීමාවක් ඇතුළත දී එසේ සැපයීම හෝ ඉදිරිපත් කිරීම කළ යුතු ය. තවද එවැනි යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් පරීක්ෂා කිරීමට ද ඒවායින් පිටපත් හෝ උද්ධෘත ලබාගැනීමට ද ඒ නිෂ්පාදන බදු නිලධරයාට ඉඩ දිය යුතු බවට ද ඒ නියමයෙන් නියම කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) යම් ස්වභාවික හේතුවක් නිසා හෝ අන් හේතුවක් නිසා තත්ත්වයෙන් ඌන වී ඇති බව සොයාගනු ලබන නැතහොත් කාලයක සිට විකුණනු නොලැබ යල් පැනගිය භාණ්ඩ බවට පත්වීමේ හේතුවෙන් හෝ වෙනත් යම් සාධාරණ හේතුවක් නිසා විකිණිය නොහැකි බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරන ලද අධිකාරීවරයකුගේ තත්ත්වයට අඩු නොවන නිලයක අඩුම වශයෙන් නිලධරයන් දෙදෙනකුගෙන් සමන්විත වන තක්සේරු මණ්ඩලයක් විසින් තීරණය කරනු ලැබුවා වූ නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ මත අය කළ හැකි නිෂ්පාදන බද්ද අඩු කිරීම සඳහා අමාත්‍යවරයා විසින් මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8අ. අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**11.** පහත දැක්වෙන අලුත් වගන්තිය 8 වන වගන්තියට ඉක්බිතිවම මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 8අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය :—

" තක්සේරු මණ්ඩලයේ තීරණවලට විරුද්ධව අභියාචනා.

8අ. (1) යම් තැනැත්තකු, 8 වන වගන්තිය යටතේ තක්සේරු මණ්ඩලය විසින් කරන ලද යම් තීරණයකින් අතෘප්තියට පත් වන්නේ නම්, ඒ තීරණය පිළිබඳ දැන්වීම තමා වෙත භාර දීමෙන් පසු දින දහහතරක් ඉකුත් වීමට පෙර ඔහු විසින් එම තීරණයට විරුද්ධව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් අභියාචනය කරනු ලැබිය හැකි ය:

එසේ වුවද ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ රෝගාතුරවීම හෝ වෙනත් සාධාරණ හේතුවක් නිසා එම කාලසීමාව ඇතුළත අභියාචනයක් ඉදිරිපත් කිරීමට අභියාචකට නොහැකි වූ බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන්නේ නම් ඔහු විසින් අභියාචනය ඉදිරිපත් කිරීම සඳහා වූ කාල සීමාව දීර්ඝ කරනු ලැබිය යුතු ය.

(2) යම් නිරණයකට එරෙහිව (1) වන උප වගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් මත අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් එම තීරණය ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් මත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කරන ලද යම් නිරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා එම තීරණය එම තැනැත්තා වෙත භාරදුන් දින සිට දින දහයක් ඉකුත්වීමට පෙර භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත ලියවිල්ලකින් අභියාචනය කරනු ලැබිය හැකි ය

(4) (3) වන උපවගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින් ගනු ලබන තීරණය අවසානාත්මක විය යුතු ය.”.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි අතුරු වගන්තියේ “අවුරුදු දහයක්” යන වචන වෙනුවට “අවුරුදු පහක්” යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (1) වන උප වගන්තියේ ඇති “එම අභියාචනය නොතකා ඒ තැනැත්තා විසින් එම තීරණය අනුව ගෙවිය යුතු නිෂ්පාදන බද්ද ගෙවනු ලැබිය යුතුය;” යන වචන වෙනුවට “එම අභියාචනය පිළිබඳව තීරණය කරන තුරු නිෂ්පාදන බද්ද හෝ එහි යම් කොටසක් ගෙවීම නවත්වන ලෙසට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කර ඇත්නම් මිස, එම අභියාචනය නොතකා ඒ තැනැත්තා විසින් එම තීරණය අනුව ගෙවිය යුතු නිෂ්පාදන බද්ද ගෙවනු ලැබිය යුතුය :” යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 12අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 12අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

"ගෙවීම පැහැර හැරීම සඳහා වූ දණ්ඩනය.

12අ. (1) මේ පනතේ කුමක් සඳහන් වුව ද යම් නිෂ්පාදන බද්දක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක, ගෙවීම පැහැර හැර ඇති තැනැත්තා විසින් ගෙවීම පැහැර හැර ඇති නිෂ්පාදන බදු මුදලට අමතරව දණ්ඩන මුදලක් වශයෙන් පහත දැක්වෙන මුදල් ගෙවනු ලැබිය යුතු ය :—

(අ) ගෙවීම පැහැර හැර ඇති මුදලින් සියයට දහයකට සමාන මුදලක් ; සහ

(ආ) නිෂ්පාදන බද්ද ගෙවිය යුතු මාසයට පසුව එළඹෙන මාසය අවසාන වීමට පෙර ගෙවීම පැහැර හරිනු ලැබූ මුදල නො ගෙවා ඇත් නම්, ගෙවීම පැහැර හැරීම පවත්නා එක් එක් පසුව එළඹෙන මාසයේ අවසාන දිනයෙන් අවසන් වන එක් එක් කාල සීමාව හෝ එම කාලසීමාවෙන් කොටසක් සම්බන්ධයෙන් ගෙවීම පැහැර හැර ඇති මුදලින් සියයට දෙකකට සමාන වැඩිදුරටත් වූ මුදලක් :

එසේ වුව ද මේ උපවගන්තිය යටතේ දණ්ඩන මුදල වශයෙන් ගෙවිය යුතු මුළු මුදල කවර අවස්ථාවකවත් ගෙවීම පැහැර හැර ඇති නිෂ්පාදන බදු මුදලින් සියයට පනහක් නොඉක්මවිය යුතු අතර ගෙවීම පැහැර හැරීම සිදු වූ විශේෂ අවස්ථානුගත කරුණුවල හේතුවෙන් එම මුදල අත්හැරීම හෝ අඩුකිරීම සාධාරණ සහ සාධාරණීය බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන්නේ නම් එවැනි යම් මුදලක් අත්හැරීම හෝ අඩු කිරීම කරනු ලැබිය හැකි ය.

(2) 10 වන වගන්තිය යටතේ අභියාචනයක් පිළිබඳ අවසාන තීරණය මත (1) වන උපවගන්තිය යටතේ යම් මුදලක් හෝ මුදල් එකතු කරනු ලැබූ ගෙවීම පැහැර හැර ඇති නිෂ්පාදන බද්දක් අඩු කරනු ලැබ ඇති අවස්ථාවක, එවිට එම මුදල හෝ මුදල් එසේ අඩු කරන ලද නිෂ්පාදන බද්ද මත ගණන් බලනු ලැබිය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 13අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 13අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"මේ පනත යටතේ ලියාපදිංචි වූ නිෂ්පාදකයන් විසින් අඩුකිරීම.

13අ. මේ පනත යටතේ ලියාපදිංචි වූ නිෂ්පාදකයකු විසින් නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ තම ව්‍යාපාරයෙහි ප්‍රයෝජනයට ගන්නා ලද්දා වූ ද නිෂ්පාදන බද්දට යටත් වූ ද භාණ්ඩ මත අයවිය යුතු නිෂ්පාදන බද්ද, පිරිවැටුම් බද්ද හෝ එම නිෂ්පාදන සහ පිරිවැටුම් යන බදු දෙකම ද ඇතුළත් වූ, යම් මුදලක් යම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් යම් කාර්තුවක් තුළ මේ පනත යටතේ ලියාපදිංචි වූ තවත් නිෂ්පාදකයකුට ගෙවනු ලැබූ අවස්ථාවක ද, එසේ ඇතුළත් කරනු ලැබූ නිෂ්පාදන බද්ද සහ පිරිවැටුම් බද්ද පළමුවෙන් සඳහන් කරන ලද නිෂ්පාදකයා විසින් එම කාර්තුව සඳහා ගෙවිය යුතු නිෂ්පාදන බදු මුදලින් අඩු කරනු ලැබිය යුතු ය:

එසේ වුවද—

(අ) එම ව්‍යාපාරය සඳහා පාවිච්චි කරන ලද යම් පිරියත, යන්ත්‍රෝපකරණ, සවිකිරීම්, ගොඩනැගිලි, වාහන හෝ වෙනත් ප්‍රාග්ධන වත්කම් සම්බන්ධයෙන්; හෝ

(ආ) 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත හෝ වෙනත් යම් නීතියක් යටතේ එකම ප්‍රදාන මත අඩුකිරීම්වලට අවසර දී ඇති අවස්ථාවක දී;

(ඇ) නිෂ්පාදන බද්දට යටත් ඒ භාණ්ඩ මිල දී ගනු ලැබුවේ පළමු කී නිෂ්පාදකයාගෙන් ද එම නිෂ්පාදකයාගෙන් අනික් නිෂ්පාදකයා පහත දැක්වෙන කරුණු සඳහන් වන වවුචරයක්, ලබාගෙන ඇත්නම් මිස—

(i) ඔහුගේ නම, තැපැල් ලිපිනය සහ ඔහුගේ ලියාපදිංචි අංකය;

(ii) මිල දී ගත් තැනැත්තාගේ නම, තැපැල් ලිපිනය සහ ලියාපදිංචි අංකයක් ඇත්නම් එම අංකය;

(iii) එක් එක් ගනුදෙනුවකට ඇතුළත් වූ දිනය;

(iv) ගනුදෙනුවේ ස්වභාවය;

(v) සපයන ලද නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ ප්‍රමාණය සහ නිෂ්පාදන බද්ද සහ පිරිවැටුම් බද්ද අය

කිරීමට පෙර එක් එක් ගනු දෙනුව සම්බන්ධයෙන් ලැබුණු හෝ ලැබිය හැකි මුදල් ප්‍රමාණය ; සහ

(vi) ඒ එක් එක් ගනුදෙනුව සඳහා ආරෝපණය කළ යුතු නිෂ්පාදන බද්ද සහ පිරිවැටුම් බද්ද

නිෂ්පාදන බද්ද සඳහා කිසිම අඩු කිරීමක් කරනු නොලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (2) වන උප වගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (ආ) මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලබන සෑම තැනැත්තකුටම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියමිත ආකෘතියෙහි වූ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු අතර එවැනි සෑම තැනැත්තකුට ම ලියාපදිංචි කිරීමේ අංකයක් වෙන් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය ඉවත් කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (3) සහ (4) වන උපවගන්ති ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :—

" (3) (1) වන උපවගන්තිය යටතේ තමා සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කරන ලද නියමය කින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඒ නියමය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඔහුට දන්වන ලද දිනයෙන් පසු දින දහයක් ඉකුත් වීමට පෙර (6) වන උපවගන්තියෙහි සඳහන් අභියාචන මණ්ඩලය වෙත ලියවිල්ලකින් වූ අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. අභියාචන මණ්ඩලය වෙත එවැනි අභියාචනයක් කරනු ලැබූ විට ඒ අභියාචනය ඉදිරිපත් කර ඇත්තේ යම් නියමයකට විරුද්ධව ද ඒ නියමය එම මණ්ඩලය විසින් ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම කරනු ලැබිය හැකි ය.

(4) (1)වන උපවගන්තිය යටතේ කරන ලද නියමයකට විරුද්ධව (3) වන උපවගන්තියෙහි සඳහන් කාලය ඇතුළත අභියාචන මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ ඇත්නම් මිස, එම නියමය

අදාල තැනැත්තාට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දැනුම් දෙනු ලැබූ දිනයේ සිට එක් මාසයක් ඉකුත් වීමෙන් පසු බලාත්මක විය යුතු ය.".

(2) එම වගන්තිය අගට පහත දැක්වෙන උපවගන්තිය ඇතුලත් කිරීමෙන් :—

"(6) මේ වගන්තියේ කාර්යය සඳහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා සහ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන මුදල් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයන් දෙදෙනකුගෙන් සමන්විත අභියාචන මණ්ඩලයක් විය යුතු ය.".

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ගොඩනැගිලි සහ ස්ථාන පරීක්ෂා කිරීමේ සහ සෝදිසි කිරීමේ බලතල.

19. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තත් කාර්යය සඳහා විශේෂයෙන් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් නිෂ්පාදන බදු නිලධරයකු විසින්, සාම නිලධරයකු ද කැටුව ගොස් පහත දැක්වෙන ක්‍රියා සියල්ලම හෝ ඉන් යම් ක්‍රියාවක් හෝ කළ හැකි ය :—

(අ) තමාගේ මතය අනුව මේ පනත යටතේ වූ යම් නඩු කටයුත්තක් සඳහා ප්‍රයෝජනවත් වන හෝ අදාල වන ගිණුම් පොත්, ලේඛන, වාර්තා හෝ වෙනත් ලියවිලි තිබිය හැකි බවට විශ්වාස කිරීමට හේතු ඇති යම් ගොඩනැගිල්ලකට හෝ ස්ථානයකට ඇතුළු වී එම ගොඩනැගිල්ල හෝ ස්ථානය සෝදිසි කිරීම සහ එම පොත්, පත් ආදිය සොයා ගනු ලැබුවහොත්, ඒවා පරීක්ෂා කිරීම ;

(ආ) එවැනි යම් ගිණුම් පොත්, ලේඛන, වාර්තා හෝ වෙනත් ලියවිලි තහනමට ගැනීම හෝ ඒවා මත හඳුනා ගැනීමේ සලකුණු තැබීම හෝ ඒවායින් උධෘත ලබා ගැනීම හෝ ඒවායින් පිටපත් ලබා ගැනීම ;

(ඇ) මේ වගන්තිය යටතේ කරන ලද යම් සෝදිසි කිරීමක දී සොයාගනු ලැබූ ද තමාගේ මතය අනුව මේ පනත යටතේ වූ යම් නඩු කටයුත්තකට ප්‍රයෝජනවත් හෝ අදාල වන්නා වූ ද වෙනත් යම් දේ පිළිබඳව සටහනක් කර ගැනීම හෝ ලේඛනයක් පිළියෙල කිරීම.

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ සෝදිසි කිරීම්වලට අදාල විධිවිධාන මේ වගන්තිය යටතේ කරනු ලබන සෝදිසි කිරීම් සම්බන්ධයෙන් හැකිතාක් දුරට අදාළ විය යුතු ය.

මේ උපවගන්තියෙහි "සාම නිලධරයා" යන්නෙහි 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ ඊට දී ඇති අර්ථය ම විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ බලතල ක්‍රියාත්මක කිරීමට යම් නිෂ්පාදන බදු නිලධරය කුට බලය දීමට පෙර, එම නිලධරයා විසින් මෙම බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වූ අවස්ථානුගත කරුණු අධ්‍යක්ෂ. ජනරාල්වරයා විසින් වාර්තා ගත කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙන ලද යම් නිෂ්පාදන බදු නිලධරයකු විසින් යම් තැනැත්තකු ගෙන් යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් තහනමට ගනු ලැබූ අවස්ථාවක දී, තමා විසින් එසේ තහනමට ගන්නා ලද පොත, ලේඛනය, වාර්තාව හෝ වෙනත් ලියවිල්ල පිළිබඳ සඳහන් වන ලියවිල්ලක් එම තැනැත්තා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(4) යම් නිෂ්පාදන බදු නිලධරයකු විසින් (1) වන උපවගන්තිය යටතේ තහනමට ගනු ලැබූ යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් පරීක්ෂා කිරීම සඳහා හෝ එම පොත, ලේඛනය, වාර්තාව හෝ වෙනත් ලියවිල්ල අයත් වන්නේ යම් තැනැත්තකුට ද එම තැනැත්තාට විරුද්ධව නඩු කටයුතු පැවරීම සඳහා අවශ්‍ය වන්නාක් කාලයකට හෝ එම නිෂ්පාදන බදු නිලධරයාගේ සන්තකයේ රඳවා තබා ගනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(2) මේ වගන්තියෙහි—

(i) "රියදුරා" යන්නට මෝටර් සයිකලයක් හෝ බයිසිකලයක් පදවන්නා ද නැවික හෝ ගුවන් යානයක කපිතාන්වරයා ද ඇතුළත් වේ;

(ii) 'වාහනය' යන්නට යම් රථයක්, කාරයක්, මෝටර් කාර් රථයක්, මෝටර් බයිසිකලයක්, බස් රථයක්, ට්‍රැක්ටරයක්, ලොරියක්, බයිසිකලයක් හෝ යන්ත්‍රානුසාරයෙන් ධාවනය කෙරෙන වෙනත් වාහනයක් ඇතුළත් වේ; තව ද

(iii) "යාත්‍රාව" යන්නට ගුවන් යානයක් ඇතුළත් වේ.".

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (1) වන උප වගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) 4 වන වගන්තියේ හෝ 5 වන වගන්තියේ හෝ 14 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වූ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වර යකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරද කරු කරනු ලැබීමේ දී රුපියල් එක් මිලියනයක් නො ඉක්මවන දඩ යකට හෝ අවුරුදු පහක් නො ඉක්මවන කාලයකට දෙයාකාර යෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.".

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"වැරදි සමථයකට පත් කිරීම.

27. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 4 වන, 5 වන සහ 14 වන වගන්ති යටතේ වූ වැරදි කිසිවක් සමථයකට පත් කරනු ලැබිය හැකි අතර නඩු තීන්දුවට පෙර එය යටතේ වූ යම් නඩු කටයුත්තක් නැවැත්වීම හෝ සමථයකට පත් කිරීම කළ හැකි ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, යම් වරදක් සමථයකට පත් කිරීමේ කොටසක් වශයෙන්, 20 වන වගන්තිය යටතේ තහනමට ගන්නා ලද යම් බෝට්ටුවක්, යාත්‍රාවක්, වාහනයක් හෝ භාණ්ඩයක්, ඒ බෝට්ටුවේ, යාත්‍රාවේ, වාහනයේ හෝ භාණ්ඩයේ ඇස්තමේන්තු කරන ලද මුළු වටිනාකමට වැඩි නොවන මුදල් ප්‍රමාණයක් ගෙවීමෙන් පසු මුදා හරිනු ලැබිය හැකි ය. වරදක් සමථයකට පත් කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලබා ගන්නා සියලු මුදල් 28 වන වගන්තියෙහි දක්වා ඇති ආකාරයට යොදා ගත යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 28අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**23.** 28 වන වගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 28අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය :—

"විශේෂ සේවා සහ පැමිණීම් සඳහා නිෂ්පාදන බදු නිලධරයන්ට මුදල් ගෙවීම.

28අ. යම් තැනැත්තකුට—

(අ) විශේෂ සේවයක් ලෙස අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන යම් සේවයක් ; හෝ

(ආ) තම නියමිත කාර්යාලය හෝ සේවා ස්ථානය නොවන යම් කාර්යාලයකට හෝ ස්ථානයකට යම් නිෂ්පාදන බදු නිලධරයකුගේ පැමිණීම

අවශ්‍ය වන අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, එම සේවය හෝ පැමිණීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි අනුප්‍රමාණ අනුව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත එම තැනැත්තා විසින් මුදල් ගෙවනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "අපනයනය කිරීම" යන්නෙහි අර්ථ කථනයට පෙරාතුව ම, පහත දැක්වෙන අලුත් අර්ථ කථන ඇතුළත් කිරීමෙන් :—

'"නියෝජිතයා" යන්නට වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් යම් ව්‍යාපාරයක අධීක්ෂණය, පාලනය හෝ කළමනාකරණය තමා වෙත ඇති යම් තැනැත්තකු ඇතුළත් වේ ;

"නිෂ්පාදන බදු නිලධරයා" යන්නෙන් මේ පනත යටතේ පත් කරන ලද සහ බලතල පවරන ලද නිලධරයකු අදහස් වේ ;';

(2) "සෑදීම" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

'"සාදන්නකු හෝ නිෂ්පාදකයකු" යන්නෙන්,

(අ) යම් භාණ්ඩයක් සාදන ;

(ආ) විකිණීම සඳහා යම් භාණ්ඩයක් සකසන්නා ;

(ඇ) බඩු පිරිසැකසුම් කරන හෝ එකලස් කරන යම් තැනැත්තකු අදහස් වේ.';

(3) "නියමිත" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

'"කාර්තුව" යන්නෙන් එක් එක් අවුරුද්දක ජනවාරි මස පළමු වන දිනයෙන්, අප්‍රේල් මස පළමුවන දින යෙන්, ජුලි මස පළමුවන දිනයෙන් සහ ඔක්තෝබර් මස පළමුවන දිනයෙන් ආරම්භ වන මාස තුනේ කාලසීමාව අදහස් වේ.'.

25. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල හැන්සාඩ් කෙටුම්පත් වල සහ පතත් වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.